# GMOA

ESTABLISHED IN 1926

TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 99955

Fax : 2503586 / 4518668

Web : www.gmoa.lk

Email : gmoasrilanka@sltnet.


28-09-2011

## පුවත්පත් නිවේදනය

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය මහතාගේ පෞද්ගලික ලිපි ගොණුව අල්ලස් හා දූෂණ විමර්ශණ ඒකකයේ නිලධාරීන් විසින් රැගෙනයාම පිළිබඳ අප සංගමයේ දැඩි විරෝධය මෙයින් පළ කරමු.

අල්ලස් හා දූෂණ විමර්ශණ ඒකකයට යම්කිසි පැමිණිල්ලක් ලැබී ඇත්නම් එහි පිටපතක් චෝදනාවට ලක්වූ නිලධාරියා වෙත ලබාදී නීතියට එකඟව විමර්ශණයක් කළ යුතුය. මෙලෙස රජයේ සේවකයන්ගේ පුද්ගලික ලිපි ගොණු අත්තනෝමතික ලෙස රැගෙනයාම නීති විරෝධී බව අපගේ හැඟීමයි.

තවද සෞඛ්‍ය අමාත්‍යාංශයේ පරිපාලන කටයුතු විභාග කළ යුත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ විමර්ශණ ඒකකය බව අප දක්වා සිටිමු. එහි පරිපාලන අඩුපාඩු ඇත්දැයි බැලීමට දූෂණ විමර්ශණ ඒකකයට සෘජු අයිතියත් නැති බවත් මේ අයුරින් ඕනෑම රජයේ සේවකයෙකුගේ පුද්ගලික ලිපි ගොණු, පැමිණිල්ලකින් තොරව රැගෙනයාමට ඉඩ හැරීම අනාගතයේ ඉතා භයානක පූර්වාදර්ශ සපයනු ඇත.

රජයේ සේවකයින්ට කිසිදු පැකිලීමකින් තොරව තම බලතල යොදා අපහාස කිරීමටත් ඉන් අනතුරුව රාජ්‍ය යාන්ත්‍රණය යොදවා ඔවුන්ට රිසි සේ දඬුවම් පැමිණවීමටත් දේශපාලඥයන්ට ඉඩකඩ සැලසීම ශිෂ්ට සම්පන්න රටකට නොගැළපේ. මෙවැනි අමනෝඥ දේශපාලඥයන් නිසා රජය අපහසුතාවයට පත්වීම කණගාටුදායක කරුණකි.

මේ පිළිබඳව ගතයුතු පියවර තීරණය කිරීමට සැප්තැම්බර් 29 බ්‍රහස්පතින්දා දහවල් 12.00 ට අප සංගමයේ මධ්‍යම කාරක සභාව රැස්වෙනු ඇත.

ස්තූතියි

ලේකම්.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය